# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1996/27 - 2016 දෙසැම්බර් මස 06 වැනි අඟහරුවාදා - 2016.12.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 14/2008 (III)

**2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත**

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 6 වන වගන්තියේ (ඉ) ඡේදය සහ 21 වන වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 51 වන වගන්තිය යටතේ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය.

2016 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹදී ය.

**නියෝග**

1. මේ නියෝග 2016 සමුද්‍රීය පරිසර ආරක්ෂණ (අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මෙම නියෝග -

(අ) ශ්‍රී ලංකාව තුළ පිහිටි යම් වරායක්, නැව් තොටක්, පර්යන්තයක්, නැව් අලුත්වැඩියා පොළක්, නිර්ජල නැව් තටාකාංගනයක්, නැංගුරම් ස්ථානයක්, අක්වෙරළ සමුද්‍ර ආශ්‍රිත පහසුකමක් හෝ වෙනත් යම් සමුද්‍ර ආශ්‍රිත පහසුකමක් සඳහා;

(ආ) ශ්‍රී ලංකාව තුළ පිහිටි යම් වරායක්, නැව්තොටක්, පර්යන්තයක්, නැව් අලුත්වැඩියා පොළක්, නිර්ජල නැව් තටාකාංගනයක්, නැංගුරම් ස්ථානයක්, අක්වෙරළ සමුද්‍ර ආශ්‍රිත පහසුකමක් හෝ වෙනත් යම් සමුද්‍ර ආශ්‍රිත පහසුකමක් වෙත පැමිණෙන හෝ ඒ තුළ ක්‍රියාත්මක වන යම් නැවක් සඳහා; සහ

(ඇ) අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැපයීම සඳහා අධිකාරිය සමඟ ලියාපදිංචි වී ඇති යම් සේවා සපයන්නකු සඳහා,අදාළ විය යුතු ය.

(2) යම් රාජ්‍යයකට අයත් හෝ යම් රාජ්‍යයක් විසින් ක්‍රියාත්මක කරනු ලබන හා එම රාජ්‍යයේ වාණිජමය නොවන සේවා සඳහා පමණක් තත්කාලයේ භාවිතා කරනු ලබන යුධනැව්, නාවික අමතර උපාංග හෝ වෙනත් නැව් සඳහා මෙම නියෝග අදාළ නොවිය යුතු ය.

3. අධිකාරිය විසින් හෝ යම් සේවා සපයන්නකු විසින් ශ්‍රී ලංකාව තුළ පිහිටි යම් වරායක්, නැව්තොටක්, පර්යන්තයක්, නැව් අලුත්වැඩියා පොළක්, නිර්ජල නැව් තටාකාංගනයක්, නැංගුරම් ස්ථානයක්, අක්වෙරළ සමුද්‍ර ආශ්‍රිත පහසුකමක් හෝ වෙනත් යම් සමුද්‍ර ආශ්‍රිත පහසුකමක් භාවිතා කරන හෝ ශ්‍රී ලංකා ජල තීරය හෝ වෙනත් යම් සමුද්‍ර කලාපයක් හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ තීරය පරික්‍රමණය කරන යම් නැවකට අයුතු ප්‍රමාදයකින් තොරව යම් අපද්‍රව්‍ය පිට කිරීමට හැකිවන පරිදි ඒ වරාය, නැව් තොට, පර්යන්තය, නැව් අලුත්වැඩියා පොළ,නිර්ජල නැව් තටාකාංගනය, නැංගුරම් ස්ථානය හෝ අක්වෙරළ සමුද්‍ර ආශ්‍රිත පහසුකම හෝ වෙනත් සමුද්‍ර ආශ්‍රිත පහසුකම තුළ හෝ ඉන් පිටත ප්‍රමාණවත් සහ ඵලදායී අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සලසනු ලැබිය යුතු ය.

1A - PG 3270 — 1507 (2016/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. (1) ශ්‍රී ලංකාව තුළ පිහිටි යම් වරායක, නැව්තොටක, පර්යන්තයක, නැව් අලුත්වැඩියා පොළක, නිර්ජල නැව් තටාකාංගනයක, නැංගුරම් ස්ථානයක, අක්වෙරළ සමුද්‍ර ආශ්‍රිත පහසුකමක හෝ වෙනත් යම් සමුද්‍ර ආශ්‍රිත පහසුකමක පවතින අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම්, එම නැවෙහි ඇති අපද්‍රව්‍ය පිට කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව විශ්වාස කිරීමට යම් නැවක අයිතිකරුට, ක්‍රියාකරවන්නාට, නෞකාධිපතිවරයාට හෝ අනුයෝජිතවරයාට විශ්වාස කිරීමට හේතු පවතින අවස්ථාවකදී ඔහු විසින් වහාම එම කරුණ පිළිබඳව අධිකාරිය වෙත දැනුම් දී ප්‍රමාණවත් අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සලසන ලෙස ඉල්ලා සිටිනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකාව තුළ පිහිටි යම් වරායකට, නැව්තොටකට, පර්යන්තයකට, නැව් අලුත්වැඩියා පොළකට, නිර්ජල නැව් තටාකාංගනයකට, නැංගුරම් ස්ථානයකට, අක්වෙරළ සමුද්‍ර ආශ්‍රිත පහසුකමකට හෝ වෙනත් යම් සමුද්‍ර ආශ්‍රිත පහසුකමකට යම් නැවක් ඇතුළු වන අවස්ථාවක, එම වරාය, නැව්තොට, පර්යන්තය, නැව් අලුත්වැඩියා පොළ, නිර්ජල නැව් තටාකාංගනය, නැංගුරම් ස්ථානය, අක්වෙරළ සමුද්‍ර ආශ්‍රිත පහසුකම හෝ වෙනත් සමුද්‍ර ආශ්‍රිත පහසුකම සතුව අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් නොමැති බවට හෝ එහි පවතින අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් ප්‍රමාණවත් නොවන බවට අධිකාරියට පෙනී යන්නේනම් අධිකාරිය විසින්-

(අ) එම වරාය, නැව්තොට, පර්යන්තය, නැව් අලුත්වැඩියා පොළ, නිර්ජල නැව් තටාකාංගනය, නැංගුරම් ස්ථානය, අක්වෙරළසමුද්‍ර ආශ්‍රිත පහසුකම හෝ වෙනත් සමුද්‍ර ආශ්‍රිත පහසුකම තුළ යම් අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සලසන ලෙස යම් සේවා සපයන්නකුට විධාන කිරීම හෝ ඒ ප්‍රතිග්‍රහණ පහසුකම් සැලසීම සඳහා කටයුතු සැලැස්වීම; සහ

(ආ) අධිකාරිය විසින් කටයුතු සලස්වනු ලැබූ එම සේවා පහසුකම් ලබා ගන්නා ලෙස ශ්‍රී ලංකාව තුළ පිහිටි එම වරාය, නැව්තොට, පර්යන්තය, නැව් අලුත්වැඩියා පොළ, නිර්ජල නැව් තටාකාංගනය, නැංගුරම් ස්ථානය, අක්වෙරළ සමුද්‍ර ආශ්‍රිත පහසුකම හෝ වෙනත් සමුද්‍ර ආශ්‍රිත පහසුකම භාරව සිටින තැනැත්තා වෙත විධාන කිරීම,

කරනු ලැබිය හැකි ය.

(3) එම වරාය, නැව්තොට, පර්යන්තය, නැව් අලුත්වැඩියා පොළ, නිර්ජල නැව් තටාකාංගනය, නැංගුරම් ස්ථානය, අක්වෙරළ සමුද්‍ර ආශ්‍රිත පහසුකම හෝ වෙනත් සමුද්‍ර ආශ්‍රිත පහසුකම භාරව සිටින තැනැත්තා හෝ අදාළ සේවා සපයන්නා විසින් ප්‍රමාණවත් අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැලසීම පැහැර හරින අවස්ථාවකදී, එම නැවේ අයිතිකරු, ක්‍රියාකරවන්නා, නෞකාධිපතිවරයා හෝ අනුයෝජිතයා විසින් එම කරුණ I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් අධිකාරිය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(4) 3 වන ඡේදය යටතේ වාර්තාවක් ලැබීමෙන් පසුව, අධිකාරිය විසින් එහි අන්තර්ගත කරුණු පිළිබඳව පරීක්ෂාකර බලා, අධිකාරිය විසින් කටයුතු සලස්වනු ලබන එකී යම් පහසුකමක සේවාවන් ලබා ගන්නා ලෙස එම වරාය, නැව්තොට, පර්යන්තය, නැව් අලුත්වැඩියා පොළ, නිර්ජල නැව් තටාකාංගනය, නැංගුරම් ස්ථානය, අක්වෙරළසමුද්‍ර ආශ්‍රිත පහසුකම හෝ වෙනත් සමුද්‍ර ආශ්‍රිත පහසුකම භාරව සිටින තැනැත්තා හෝ අදාළ සේවා සපයන්නා වෙත විධාන කරනු ලැබිය යුතු ය.

5. අධිකාරිය සමඟ ලියාපදිංචි වී ඇති සේවා සපයන්නකු හැර වෙනත් කවර හෝ තැනැත්තකු විසින්, යම් වරායක්, නැව්තොටක්, පර්යන්තයක්, නැව් අලුත්වැඩියා පොළක්, නිර්ජල නැව් තටාකාංගනයක්, නැංගුරම් ස්ථානයක්, හෝ අක්වෙරළ සමුද්‍ර ආශ්‍රිත පහසුකමක් හෝ වෙනත් යම් සමුද්‍ර ආශ්‍රිත පහසුකමක් භාවිත කරන හෝ ශ්‍රී ලංකා ජල තීරය හෝ වෙනත් සමුද්‍ර කලාපයක් හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ තීරය පරික්‍රමණය කරන කිසිදු නැවකින් අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණය නොකළ යුතු ය.

6. (1) සේවා සපයන්නකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම මෙම නියෝග වල III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව ද සමඟ, II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන ඡේදය යටතේ වූ යම් ඉල්ලුම්පත්‍රයක් සමඟ, පහත දැක්වෙන ලේඛන ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එනම්:-

(අ) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන සංස්ථාගත කිරීමේ සහතිකයේ පිටපතක් ;

(ආ) 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නිකුත් කරන ලද, අදාළ කාණ්ඩය සඳහා වරායක් තුළ මෙහෙයුම් කටයුතු සිදුකිරීමේ කාර්යය සඳහා ලබාගත් බලපත්‍රයේ පිටපතක්;

(ඇ) නැව්වලින් සුන්බුන් එකතු කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නිෂ්කාශන ලිපියේ පිටපතක්;

(ඈ) අන්තරායදායක තෙල් අපද්‍රව්‍ය එකතු කිරීමේ, ගබඩා කිරීමේ, ප්‍රවාහනය කිරීමේ සහ බැහැර කිරීමේ කාර්ය සඳහා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත්කරන ලද උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රයේ පිටපතක්;

(ඉ) අදාළ පළාත් පාලන ආයතනය විසින් හෝ අධිකාරිය විසින් අනුමත කරන ලද වෙනත් යම් නියෝජිත ආයතනයක් විසින් නිකුත් කරන ලද ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා වූ අවසර පත්‍රයේ පිටපතක්;

(ඊ) අදාළ පළාත් පාලන ආයතනය විසින් හෝ අධිකාරිය විසින් අනුමත කරන ලද වෙනත් යම් නියෝජිත ආයතනයක් විසින් නිකුත් කරන ලද මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා වූ අවසර පත්‍රයේ පිටපතක්;

(උ) තෙල් ඉවත්කිරීමේ නල සම්බන්ධයෙන් ISO සහතිකලත් නල පරීක්ෂණ සමාගමක් විසින් නිකුත්කරන ලද, නල පරීක්ෂණ සහතිකයේ පිටපතක්;

(ඌ) ප්‍රතිග්‍රහණ මෙහෙයුම්වල යෙදෙන තැනැත්තන්ට අදාළ විස්තර;

(එ) ප්‍රතිග්‍රහණ මෙහෙයුම්වල යෙදෙන තැනැත්තන්ගේ භාවිතය සඳහා ඇති ආරක්ෂිත උපකරණවලට අදාළ විස්තර;

(ඒ) හදිසි පිටාරගැලීමක් අවමකර ගැනීම පිණිස භාවිත කිරීම සඳහා පවතින වැළකුම් උපකරණවලට අදාළ විස්තර; සහ

(ඔ) අන්තරායදායක ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා ඇති ලෝහමය ටැංකි පරීක්ෂා කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ වාර්තාවේ පිටපතක්.

(3) ඉල්ලුම්පත්‍රය ඇගැයීමේ කාර්යය සඳහා වෙනත් යම් තොරතුරු ද සපයන ලෙස අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි ය.

(4) යම් ධීවර වරායක ධීවර යාත්‍රාවලට අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැලසීම සඳහා සේවා සපයන්නකු වශයෙන් ලියාපදිංචිවීමට ඉල්ලුම්කරු අපේක්ෂා කරන අවස්ථාවකදී, ඔහුගේ ඉල්ලුම් පත්‍රය අදාළ ධීවර වරායේ වරාය කළමනාකරු විසින් පිටසන් කරනු ලැබිය යුතු ය.

7. (1) 6 වන නියෝගයේ (1) වන ඡේදය හෝ (4) වන ඡේදය යටතේ ඉල්ලුම්පත්‍රයක් ලැබීමෙන් පසුව; අධිකාරිය විසින් ඉල්ලුම්පත්‍රය ලැබීමේ දින සිට දින දාහතරක කාලයක් ඇතුළත අධිකාරිය විසින් ස්වකීය තීරණය ඉල්ලුම්කරු වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) ලියාපදිංචිය සඳහා වූ ඉල්ලුම්පත්‍රය අධිකාරිය විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක ඒ පිළිබඳ දැන්වීම ලැබී දින දාහතරක් ඇතුළත, ඉල්ලුම්කරු විසින් මෙම නියෝගවල III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව ගෙවනු ලැබිය යුතු ය.

(3) අධිකාරිය විසින් යම් ඉල්ලුම්පත්‍රයක් අනුමත කරනු ලබන අවස්ථාවකදී, අධිකාරිය විසින් එම ඉල්ලුම්කරු සේවා සපයන්නකු වශයෙන් ලියාපදිංචිකර, අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි නියම, කොන්දේසි සහ ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රමිතීන්ට යටත්ව, මෙම නියෝගවල IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් වූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) නිකුත් කරන ලද යම් ලියාපදිංචි කිරීමේ සහතිකයක් කලින් අත්හිටුවනු ලැබුවහොත් හෝ අවලංගු කරනු ලැබුවහොත් මිස, එක් ලිත් වර්ෂයක් සඳහා වලංගු විය යුතු ය.

(5) සේවා සපයන්නකු විසින් ලියාපදිංචිය සඳහා වූ ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති යම් විස්තරවල කරන ලද යම් වෙනස්කමක් හෝ කිරීමට යෝජිත යම් වෙනස්කමක් පිළිබඳව හෝ ඒ ලියාපදිංචිය අවලංගු කිරීමට තමා අදහස් කරන්නේ නම් ඒ පිළිබඳව හෝ වහාම අධිකාරිය වෙත දැනුම් දිය යුතු ය.

8. (1) ලියාපදිංචි සේවා සපයන්නකු විසින්, යම් යෝජිත අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ කටයුත්තක් කරනු ලැබීමට සැලසුම් කොට ඇති දිනයට යටත් පිරිසෙයින් එක් වැඩකරන දිනයකට හෝ පෙරාතුව, එක් එක් අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ කටයුත්ත වෙනුවෙන්, මෙම නියෝගවල III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව ද සමගින්, මෙම නියෝගවල V වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් වෙබ් අඩවි පාදක මාර්ගගත කාර්ය පටිපාටිය භාවිත කරමින් (මෙහි මින්මතු මෙම නියෝගවල "අවසරපත්‍රය" යනුවෙන් සඳහන් කරනු ලබන) අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ අවසරපත්‍රයක් ලබාගැනීම සඳහා අධිකාරිය වෙත ඉල්ලුම්කරනු ලැබිය යුතු ය.

(2) අවසරපත්‍රයක් ලබාගැනීම සඳහා අධිකාරියේ කාර්යාලය වෙත කරනු ලබන, සෑම වෙබ් අඩවි පාදක මාර්ගගත ඉල්ලීමක් සතියේ ඕනෑම දිනයක දවසේ ඕනෑම වේලාවක දී ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

(3) (1) වන ඡේදයේ සඳහන් විධිවිධාන යම් සේවා සපයන්නකු විසින් සපුරා ඇති අවස්ථාවක දී, අධිකාරිය විසින් එම සේවා සපයන්නා වෙත මෙම නියෝගවල VI වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් වූ අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) අධිකාරිය විසින් නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක්ම එම අවසර පත්‍රය ලබා ගත්තේ යම් නිශ්චිත අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ කටයුත්තක් සඳහා ද එම කටයුත්ත සඳහා පමණක් භාවිත කරනු ලැබිය යුතු ය.

(5) අවසර පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති අපද්‍රව්‍ය කාණ්ඩ සඳහා පමණක් අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැලසීමට සෑම අවසරපත්‍ර ලාභියකුට ම බලය පවරනු ලැබිය යුතු ය.

9. (1) අධිකාරිය විසින් බලය පවරන ලද යම් නිලධරයකුට, සේවා සපයන්නකු විසින් තත් කාර්ය සඳහා යොදා ගෙන ඇති උපකරණ ඇතුළත්ව අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ කටයුත්තේ ඕනෑම අංගයක් පරීක්ෂා කර බැලීම සඳහා සහ පාරිසරික වශයෙන් ආරක්ෂිතව අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණය සහ බැහැර කිරීම සිදුවන බවට වගබලා ගැනීමට අවශ්‍ය උචිත පියවර ගැනීම සිදුවන බවට වගබලා ගැනීම සඳහා බලය තිබිය යුතු ය.

(2) සෑම සේවා සපයන්නකු ම විසින්, අවසර පත්‍රයක් යටතේ එක් එක් අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ කටයුත්ත සම්පූර්ණ කිරීමෙන් පසුව එම කටයුත්ත සම්පූර්ණ කිරීමෙන් පසු පැය විසිහතරක කාලයක් ඇතුළත එකී ප්‍රතිග්‍රහණ කටයුත්ත සම්පූර්ණ කිරීමට අදාළ විස්තර අධිකාරිය වෙත සපයනු ලැබිය යුතු ය.

(3) මෙම නියෝගයේ (2) වන ඡේදයේ සඳහන් විධිවිධානවලට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරින යම් සේවා සපයන්නකු වෙත අධිකාරිය විසින් අලුත් අවසරපත්‍ර නිකුත් කරනු නොලැබිය යුතු ය.

10. (1) ශ්‍රී ලංකාව තුළ පිහිටි යම් වරායක්, නැව්තොටක්, පර්යන්තයක්, නැව් අලුත්වැඩියා පොළක්, නිර්ජල නැව් තටාකාංගනයක්, නැංගුරම් ස්ථානයක්, අක්වෙරළසමුද්‍ර ආශ්‍රිත පහසුකමක් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් සමුද්‍ර ආශ්‍රිත පහසුකමක් වෙත පැමිණෙන යම් නැවක අයිතිකරු, ක්‍රියාකරවන්නා, නෞකාධිපතිවරයා හෝ අනුයෝජිතයා විසින් -

(අ) එසේ පැමිණීමට යටත් පිරිසෙයින් පැය විසිහතරකට පෙරාතුව; හෝ

(ආ) අනපේක්ෂිත අවස්ථානුගත තත්වයන් යටතේ පැය විසිහතරකට පෙර දැන්වීම කිරීමට නොහැකි අවස්ථාවක දී, එම අවස්ථානුගත තත්වයන් පිළිබඳව දැනගනු ලැබූ විගස ; හෝ

(ඇ) යාත්‍රා කාලය පැය විසිහතරකට වඩා අඩු වන විටෙක දී යටත් පිරිසෙයින් පූර්ව වරායෙන් නැව පිටත්වන අවස්ථාවේදී;

නැව පැමිණීම පිළිබඳව සහ එම නැවේ එකතුවී පවතින අපද්‍රව්‍යවලට අදාළ තොරතුරු සහ එහි ගබඩා ධාරිතාවය පිළිබඳ තොරතුරු මෙම නියෝගවල VII වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් වෙබ් අඩවි පාදක මාර්ගගත පද්ධතිය හරහා අධිකාරිය වෙත දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකාව තුළ පිහිටි යම් වරායක්, නැව්තොටක්, පර්යන්තයක්, නැව් අලුත් වැඩියා පොළක්, නිර්ජල නැව් තටාකාංගනයක්, නැංගුරම් ස්ථානයක්, අක් වෙරළ සමුද්‍ර ආශ්‍රිත පහසුකමක් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් සමුද්‍ර ආශ්‍රිත පහසුකමක් වෙත පැමිණෙන යම් නැවක අයිතිකරු, ක්‍රියාකරවන්නා, නෞකාධිපතිවරයා, හෝ අනුයෝජිතයා විසින් එකී නැව එම වරායෙන්, නැව්තොටෙන්, පර්යන්තයෙන්, නැව් අලුත්වැඩියාපොළෙන්, නිර්ජල නැව් තටාකාංගනයෙන්, නැංගුරම් ස්ථානයෙන් හෝ අක්වෙරළ සමුද්‍ර ආශ්‍රිත පහසුකමෙන් හෝ වෙනත් සමුද්‍ර ආශ්‍රිත පහසුකමෙන් පිටත්ව යාමට පෙරාතුව, එකී වරාය, නැව්තොට, පර්යන්තය, නැව් අලුත්වැඩියා පොළ ; නිර්ජල නැව් තටාකාංගනය, නැංගුරම් ස්ථානය හෝ අක්වෙරළ සමුද්‍ර ආශ්‍රිත පහසුකම හෝ වෙනත් සමුද්‍ර ආශ්‍රිත පහසුකම භාරව සිටින තැනැත්තා විසින් හෝ ශ්‍රී ලංකාවේ යම් සේවා සපයන්නකු විසින් හෝ අධිකාරිය විසින් සලසනු ලබන අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකමක් වෙත සියලු අපද්‍රව්‍ය පිටකර ඇතිබවට වගබලාගත යුතු ය.

11. (1) යම් නැවක් විසින් 10 වන නියෝගයේ (1) සහ (2) වන ඡේදවලට අනුකූලව ක්‍රියාකර නොමැති බවට විශ්වාස කිරීමට අධිකාරිය වෙත හේතු පවතින අවස්ථාවක දී, අධිකාරිය විසින්, එම නැවේ ඊළග නැවතුම් වරායසම්මුතියේ යම් සාමාජික රාජ්‍යයක වරායක් වේ නම්, නැවෙහි ඇති අපද්‍රව්‍ය පිටනොකිරීම පිළිබඳ තොරතුරුද සමග ඒ නැව පිළිබඳව එම රාජ්‍යයේ නිසි බලධරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) සම්මුතිය මගින් නියම කර ඇති පරිදි, දැන්වීමක් කිරීමේ නියමයට අනුකූලව ක්‍රියාකිරීම යම් නැවක් පැහැරහැර ඇති බවට හෝ, එම සාමාජික රාජ්‍යයේ යම් වරායක දී අපද්‍රව්‍ය කිසිවක් පිටකිරීමෙන් තොරව යම් නැවක් මුහුදු ගමන් ආරම්භ කර ඇති බවට සම්මුතියේ යම් සාමාජික රාජ්‍යයක නිසි බලධරයාගෙන් අධිකාරිය වෙත යම් තොරතුරක් ලැබී ඇති අවස්ථාවක දී, අධිකාරිය විසින් ශ්‍රී ලංකාව තුළ පිහිටි යම් වරායකට, නැව්තොටකට, පර්යන්තයනට, නැව් අලුත්වැඩියා පොළකට, නිර්ජල නැව් තටාකාංගනයකට, නැංගුරම් ස්ථානයකට, අක්වෙරළසමුද්‍ර ආශ්‍රිත පහසුකමකට හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් සමුද්‍ර ආශ්‍රිත පහසුකමකට එම නැව පැමිණි පසුව එකී නැව පරීක්ෂාකර බලනු ලැබිය යුතු ය.

12. (1) යම් නැවක්, යම් වරායකට, නැව්තොටකට, පර්යන්තයකට, නැව් අලුත්වැඩියා පොළකට, නිර්ජල නැව් තටාකාංගනයකට, නැංගුරම් ස්ථානයකට හෝ අක්වෙරළසමුද්‍ර ආශ්‍රිත පහසුකමකට හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් සමුද්‍ර ආශ්‍රිත පහසුකමකට පැමිණ ඇති අවස්ථාවක දී ඒ නැවට ඇතුළු වී, ඒ නැව 10 වන නියෝගයේ සඳහන් නියමයන්ට අනුකූලව ක්‍රියාකර ඇත්තේද යන්න පිළිබඳව නිශ්චය කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරීක්ෂාවන් කරන ලෙස යම් බලය දෙනු ලැබූ නිලධරයකු වෙත අධිකාරිය විසින් විධාන කරනු ලැබිය හැකි ය.

(2) 10 වන නියෝගයේ 2 වන ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, ඊළග නැවතුම් වරාය දක්වා අපේක්ෂිත මුහුදු ගමන තුළදී එකතු විය හැකි අපද්‍රව්‍ය ද ඇතුළත්ව, නැවෙහි ඇති සියලු අපද්‍රව්‍ය සඳහා එකී නැව තුළ ප්‍රමාණවත් ගබඩා ධාරිතාවක් පවතින බවට 10 වන නියෝගයේ (1) වන ඡේදය යටතේ සපයන ලද තොරතුරු මගින් අධිකාරිය සෑහීමකට පත්වන්නේ නම්, අපද්‍රව්‍ය පිටකිරීමෙන් තොරව ඊළග වරාය වෙත යාත්‍රා කිරීම සඳහා යම් නැවකට ඉඩදෙනු ලැබිය හැකි ය.

(3) ඊළග නැවතුම් වරාය දක්වා අපේක්ෂිත මුහුදු ගමන තුළදී එකතු විය හැකි අපද්‍රව්‍යද ඇතුළත්ව, සියලු අපද්‍රව්‍ය සඳහා නැවක් තුළ ප්‍රමාණවත් ගබඩා ධාරිතාවක් පවතින බවට අධිකාරිය විසින් සෑහීමට පත් නොවන අවස්ථාවකදී හෝ එකී නැවතුම් වරාය තුළ ප්‍රමාණවත් අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් නොමැති බවට විශ්වාස කිරීමට අධිකාරිය වෙත හේතු පවතින අවස්ථාවක දී, එම නැව ශ්‍රී ලංකාවේ එම වරායෙන් පිටත්ව යාමට පෙරාතුව සේවා සපයන්නකු වෙත එම නැවෙහි ඇති අපද්‍රව්‍ය පිටකරන ලෙස නියම කරමින් අධිකාරිය විසින් එම නැවේ අයිතිකරු, ක්‍රියාකරවන්නා, නෞකාධිපතිවරයා හෝ අනුයෝජිතයා වෙත විධානයක් කරනු ලැබිය හැකි ය.

13. යම් සේවා සපයන්නකු විසින් ප්‍රතිග්‍රහණය කරනු ලබන අපද්‍රව්‍ය, අධිකාරිය විසින් විධාන කරනු ලබන පරිදි උචිත ආකාරයෙන් බැහැර කිරීමට ඒ සෑම සේවා සපයන්නකුම වගබලා ගත යුතු ය.

14. මෙහි සඳහන් යම් නියෝගයක් උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 53 වන වගන්තිය යටතේ රුපියල් මිලියන තුනක් නොඉක්මවන දඩ මුදලකට එම තැනැත්තා යටත්විය යුතු ය.

15. මේ නියෝගවල -

"අධිකාරිය" යන්නෙන්, 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය අදහස් වේ;

"සම්මුතිය" යන්නෙන්, සංශෝධිත පරිදි වූ 1978 ප්‍රටෝකෝල් (මාපෝල් 73/78)(MARPOL 73/78) මගින් සංශෝධිත 1973 නැව්වලින් සිදුවන දූෂණය වැළැක්වීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය අදහස් වේ;

"පිටකිරීම" යන්නට යම් මුදාහැරීමක්, බැහැර කිරීමක්, පිටාර ගැලීමක්, කාන්දුවීමක්, පිරවීමක්, පිටකිරීමක්, හෝ හිස්කිරීමක් ඇතුළත්වන නමුත් ඊට-

(අ) 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 27 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයකට අනුකූලව වූ යම් ඉවත දැමීමක්; හෝ

(ආ) දූෂණය අවම කිරීම හෝ පාලනය හා සම්බන්ධ යම් නීත්‍යානුකූල විද්‍යාත්මක පර්යේෂණවල කාර්ය සඳහා හානිකර ද්‍රව්‍ය මුදා හැරීම,

ඇතුළත් නොවේ;

"කසළ" යන්නෙන්, සම්මුතියේ ඇමුණුම්වල අර්ථ නිරූපණය කර ඇති හෝ ලැයිස්තුගත කර ඇති ද්‍රව්‍ය හැර නැවේ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු අතරතුර ඇතිවන සහ අඛණ්ඩව හෝ කලින් කල බැහැර කිරීමට නියමිත, අලුත් මාළු සහ ඒවායේ කොටස් හැර සියළුම වර්ගයේ ආහාරමය, ගෘහස්ථ සහ මෙහෙයුම් අපද්‍රව්‍ය අදහස් වේ ;

"විෂ සහිත ද්‍රාවණ" යන්නෙන්, 1978 ප්‍රටෝකෝල් (මාපොල් 73/78)(MARPOL 73/78) මගින් සංශෝධිත 1973 නැව්වලින් සිදුවන දූෂණය වැළැක්වීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ II වන ඇමුණුමේ II වන පරිශිෂ්ඨයේ නම් කර ඇති යම් ද්‍රව්‍යයක් හෝ මාපෝල් 73/78(MARPOL 73/78) ලේඛනයේ 3(4) නියෝගයේ ඒ,බී,සී හෝ ඩී වර්ගවලට අයත් බවට එකී නියෝගයේ විධිවිධාන යටතේ තාවකාලිකව තක්සේරු කර ඇති ද්‍රව්‍යයක් අදහස් වේ ;

"සේවා සපයන්නා" යන්නෙන්, යම් වරායකදී, නැව් තොටකදී, පර්යන්තයකදී, නැව් අලුත්වැඩියා පොළකදී, නිර්ජල නැව් තටාකාංගනයකදී, නැංගුරම් ස්ථානයකදී, අක්වෙරළසමුද්‍ර ආශ්‍රිත පහසුකමකදී හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් සමුද්‍ර ආශ්‍රිත පහසුකමකදී නැව්වලට අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැලසීම සඳහා මෙම නියෝග යටතේ අධිකාරිය සමග ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකු අදහස් වේ ;

"මල අපද්‍රව්‍ය" යන්නෙන් -

(අ) නැවක් තුළ වූ ඕනෑම ආකාරයක වැසිකිළි සහ කැසිකළි මල පවහන හා වෙනත් අපද්‍රව්‍ය ;

(ආ) යම් බෙහෙත් ශාලාවක් සහ රෝගීන් සඳහා වූ ස්ථානයක් ඇතුළු වෛද්‍ය පරිශ්‍රවල පිහිටා ඇති සේදීමේ බේසමක, සේදීමේ බාල්දි හෝ දිය කවුලු හරහා පිටවන අපද්‍රව්‍ය ;

(ඇ) සජීවී සතුන් සිටින ස්ථානවලින් පිටවන අපද්‍රව්‍ය ; හෝ

(ඈ) ඉහත (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් යම් අපද්‍රව්‍ය මිශ්‍ර වී ඇති වෙනත් අපවිත්‍ර ජලය,

අදහස් වේ;

"නැවෙහි අපද්‍රව්‍ය" යන්නෙන් පහත දැක්වෙන විස්තරවලට අයත් යම් අපද්‍රව්‍ය අදහස් වේ. එනම්:-

(අ) නැව්බඩු අවශේෂයන්;

(ආ) විෂ සහිත ද්‍රාවණ;

(ඇ) නැවෙහි උත්පාදනය වන අපද්‍රව්‍ය; සහ

(ඈ) නැවෙහි උත්පාදනය වන මල අපද්‍රව්‍ය;

"නැවෙහි උත්පාදනය වන මල අපද්‍රව්‍ය" යන්නෙන්, යම් නැවක් සේවා සැපයීමේ කාලය තුළදී උත්පාදනය වන සියලු මල අපද්‍රව්‍ය අදහස් වේ ;

"නැවෙහි උත්පාදනය වන අපද්‍රව්‍ය" යන්නෙන්, යම් නැවක් සේවා සැපයීමේ කාලය තුළදී උත්පාදනය වන කසළ, තෙල් සහ තෙල් මිශ්‍රණ අදහස් වන නමුත් ඊට නැව්බඩු අවශේෂයන් ඇතුළත් නොවේ ; සහ

"අපද්‍රව්‍ය" යන්නට කසළ, නැවෙහි අපද්‍රව්‍ය, නැවෙහි උත්පාදනය වන අපද්‍රව්‍ය, නැවෙහි උත්පාදනය වන මල අපද්‍රව්‍ය, මල අපද්‍රව්‍ය, තෙල් අපද්‍රව්‍ය, දූෂක ද්‍රව්‍ය හෝ විෂ සහිත ද්‍රාවණ ඇතුළත් වේ.

4 (3) වන නියෝගය

1 වන උපලේඛනය

**අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් ප්‍රමාණවත් නොවන බව වාර්තා කිරීමේ ආකෘති පත්‍රය.**

**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය.**

යම් ප්‍රතිග්‍රහණ පහසුකමක් වෙත අපද්‍රව්‍ය පිටකිරීමේ දී දුෂ්කරතාවලට මුහුණ දෙන යම් නැවක අයිතිකරු, ක්‍රියාකරවන්නා, නෞකාධිපතිවරයා හෝ අනුයෝජිතයා විසින් අදාළ සනාථ කිරීමේ ලේඛන ද සමග පහත දැක්වෙන තොරතුරු සාමාන්‍යාධිකාරී, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA), අංක 758, බේස්ලයින් පාර, කොළඹ 9, ශ්‍රී ලංකාව යන ලිපිනය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ;

දුරකථන අංක :- (+94)112687520 ෆැක්ස් :- (+94)114615960

1. නැව පිළිබඳ විස්තර

1.1 නැවේ නම : ..............................................................

1.2 නැවේ අයිතිකරුගේ, ක්‍රියාකරවන්නාගේ, නෞකාධිපතිවරයාගේ හෝ අනුයෝජිතයාගේ නම : .............................................

1.3 විශේෂිත අංකය හෝ අක්ෂරය : ..............................................................

1.4 ලියාපදිංචි වරාය : ..............................................................

1.5 නැවේ වර්ගය :

| | | | |
|---|---|---|---|
| තෙල් නැව | ☐ | රසායනික දියර ප්‍රවාහන නැව | ☐ |
| මගී ප්‍රවාහන නැව | ☐ | භාණ්ඩ ප්‍රවාහන නැව | ☐ |

වෙනත් (සඳහන් කරන්න) ..............................................................

2. වරාය පිළිබඳ විස්තර :-

2.1 රටෙහි නම :- ..............................................................

2.2 වරායේ, නැව්තොටේ, පර්යන්තයේ, නැව් අලුත්වැඩියා පොළේ, නිර්ජල නැව් තටාකාංගනයේ, නැංගුරම් ස්ථානයේ හෝ අක්වෙරළ සමුද්‍ර ආශ්‍රිත පහසුකමේ හෝ වෙනත් සමුද්‍ර ආශ්‍රිත පහසුකමේ නම :- ..............................................................

2.3 ස්ථානයේ හෝ පර්යන්තයේ නම :- ..............................................................

2.4 අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම සලසන සමාගමේ නම (අදාළ වේ නම්) :- ..............................................................

2.5 ගොඩ බෑමේ වරාය :- .............................. පැටවීමේ වරාය ............................... හා නැව් අංගනය ..................................

2.6 සිදු වීමේ දිනය:- ..............................................................

3. ප්‍රතිග්‍රහණ පහසුකම වෙත පිටකිරීමට නියමිත අපද්‍රව්‍ය වර්ගය හා ප්‍රමාණය:-

3.1 තෙල් අපද්‍රව්‍ය:-

3.1.1 තෙල් අපද්‍රව්‍ය වර්ගය:

තෙල් සහිත නැව්:

යන්ත්‍රාගාරවල පතුලේ රැඳෙන තෙල් මිශ්‍රිත ජලය ............................. ඉන්ධන වල තෙල් බොර ............................ තෙල් පිරිපහදු ................................. ටැංකි පිරිසිදු කිරීමේදී පිට කරන යකඩ මළ හා තෙල් බොර ........................... අපවිත්‍ර බැලස්ට් ජලය ..................................... ටැංකි සේදීම් ................................................. වෙනත් (සඳහන් කරන්න) ..................................................

3.1.2 ප්‍රතිග්‍රහණ පහසුකම වෙත පිට කිරීමට ඇති තෙල් අපද්‍රව්‍ය ප්‍රමාණය:- .......................................................... $m^3$

3.2 විෂ සහිත ද්‍රාවණ (NLS) :

3.2.1 ප්‍රතිග්‍රහණ පහසුකම වෙත පිට කිරීමට ඇති, පූර්ව සේදීමෙන් ලැබෙන විෂ සහිත ද්‍රාවණ අවශේෂ හෝ ජල මිශ්‍රණවල වර්ගය:-

කාණ්ඩය:- A.........B...........C............ කාණ්ඩයේ ද්‍රව්‍ය හෝ වෙනත් (සඳහන් කරන්න) ....................................

3.2.2 අදාළ ද්‍රව්‍ය ඝන බවට පත් වූ .................. හෝ ඉහළ දුස්ස්‍රාවීයතාවයක් සහිත .................ලෙස නම් කොට ඇත.

3.2.3 අන්තර්ගත විෂ සහිත ද්‍රාවණයේ නම:- ......................................................

3.2.4 ප්‍රතිග්‍රහණ පහසුකම වෙත මුදා හැරීමට ඇති විෂ සහිත ද්‍රාවණ අවශේෂ හෝ ජල මිශ්‍රණයේ ප්‍රමාණය :-

.............................................. $m^3$

3.3 කසළ:

ප්‍රතිග්‍රහණ පහසුකම වෙත පිට කිරීමට ඇති කසළ වර්ගය සහ ප්‍රමාණය :-

ආහාර අපද්‍රව්‍ය ............................................ $m^3$ නැව්බඩු ආශ්‍රිත අපද්‍රව්‍ය ................................................ $m^3$

නඩත්තු අපද්‍රව්‍ය .......................................... $m^3$ වෙනත් (සඳහන් කරන්න) ............................................ $m^3$

4. ප්‍රතිග්‍රහණ පහසුකම විසින් භාර නොගත් අපද්‍රව්‍යවල වර්ගය සහ ප්‍රමාණය :-

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

5. මුහුණ දීමට සිදු වූ විශේෂිත ගැටලු:- (කරුණාකර අදාළ කොටුව තුළ "✓" ලකුණ යොදන්න)

(අ) ප්‍රතිග්‍රහණය ප්‍රතික්ෂේප කරන ලදී ☐

(ආ) අනිසි ප්‍රමාදය ☐

(ඇ) පහසුකම් දුෂ්කර ස්ථානයක ස්ථානගත කර තිබීම ☐

(ඈ) පහසුකම් භාවිතා කිරීම තාක්ෂණිකව අපහසු වීම ☐

(ඉ) වෙනත් ☐ කරුණාකර සඳහන් කරන්න ......................................................

ඉහත හඳුනාගනු ලැබූ ගැටලු පිළිබඳ විස්තර නිශ්චිතව දක්වන්න :-

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

6. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් ගනුලැබූ පියවර:-
ප්‍රතිග්‍රහණ පහසුකම් ප්‍රමාණවත් නොවීම පිළිබඳව ඔබ විසින් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත දැනුම් දුන්නේද?.........................

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් ඔබගේ ගැටලුවට අවධානය යොමු කර ඔබ සෑහීමකට පත්වන පරිදි එම ගැටලුව විසඳනු ලැබුවේද? ..............................................

7. විශේෂ කරුණු:- (උදා:– ප්‍රතිග්‍රහණ පහසුකම් භාවිතා කිරීම සඳහා කරන ලද ඉල්ලීම පිළිබඳ විස්තර, ඉහත 4 වන අයිතමය යටතේ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියෙන්, වරාය බලධාරීන්ගෙන් හෝ සේවා සපයන්නන් ගෙන් ලැබුණු තොරතුරු සහ එම ගැටලුව සම්බන්ධයෙන් සම්බන්ධ කර ගන්නා ලද නිලධරයන්ගේ නම්) ............................................................

............................................................

............................................................

දිනය:- ................................ ..............................................................................

නැවේ අයිතිකරුගේ/ක්‍රියාකරවන්නාගේ/නෞකාධිපතිවරයාගේ/
අනුයෝජිතයාගේ අත්සන

6 වන නියෝගය

II වන උපලේඛනය

| ඉල්ලුම්පත්‍ර අංකය | |
|---|---|

සේවා සපයන්නකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය 20xx

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA)

| | | | |
|---|---|---|---|
| 1. ලියාපදිංචි ව්‍යාපාර නාමයඃ | | | |
| 2. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකයඃ | | | |
| 3. MEPAසමඟ ගනුදෙනු කිරීම සඳහා බලය දෙන ලද තැනැත්තන්ඃ | 1. | | |
| | 2. | | |
| | 3. | | |
| 4. සමාගමේ ලිපිනයඃ | | | |
| 5. දුරකථන අංකයඃ | | 6. ජංගම දුරකථන අංකය ඃ | |
| 7. ෆැක්ස් අංකය ඃ | | 8. විද්‍යුත් ලිපිනය ඃ | |

| 9. 20xx වර්ෂය සඳහා ඔබ ලියාපදිංචි වන අපද්‍රව්‍ය වර්ග (කරුණාකර අදාළ කොටුව තුළ ‘‘ ’’ ලකුණු යොදන්න) | තෙල් අපද්‍රව්‍ය ☐ | කසළ ☐ | මළ අපද්‍රව්‍ය ☐ |
|---|---|---|---|

| 10. ඔබ ලියාපදිංචි වන වරායන් | සියලු වරායන් ☐ | කොළඹ ☐ | ගාල්ල ☐ | හම්බන්තොට ☐ | ත්‍රිකුණාමලය ☐ |
|---|---|---|---|---|---|

11. අපද්‍රව්‍ය බැහැර කිරීමේ පරිශ්‍රය පිළිබඳ විස්තර. (වෙනම පරිශ්‍රයන් භාවිතා කරන්නේ නම් වෙන වෙනම සඳහන් කරන්න)

11.1 තෙල් අපද්‍රව්‍ය සඳහා

| අපද්‍රව්‍ය බැහැර කිරීමේ පරිශ්‍රයේ නම | ලිපිනය | (මධ්‍යම පරිසර අධිකාරිය (CEA) විසින් නිකුත් කරන ලද) SWML අංකය |
|---|---|---|
| | | SWML විස්තර ඃ-<br>නිකුත් කළ දිනය ඃ- |
| | | කල් ඉකුත් වන දිනය ඃ-<br>SWML අංකය ඃ- |
| | | නිකුත් කළ දිනය ඃ-<br>කල් ඉකුත් වන දිනය ඃ-<br>SWML අංකය ඃ-<br>නිකුත් කළ දිනය ඃ-<br>කල් ඉකුත් වන දිනය ඃ- |

11.2 කසළ සඳහා

| අපද්‍රව්‍ය බැහැර කිරීමේ පරිශ්‍රයේ නම | ලිපිනය | විස්තර |
|---|---|---|
| | | බලපත්‍ර අංකය ඃ-<br>නිකුත් කළ දිනය ඃ-<br>කල් ඉකුත් වන දිනය ඃ-<br>බලපත්‍ර අංකය ඃ-<br>නිකුත් කළ දිනය ඃ-<br>කල් ඉකුත් වන දිනය ඃ- |

11.3 මළ අපද්‍රව්‍ය සඳහා

| අපද්‍රව්‍ය බැහැර කිරීමේ පරිශ්‍රයේ නම | ලිපිනය | විස්තර |
|---|---|---|
| | | බලපත්‍ර අංකය ඃ-<br>නිකුත් කළ දිනය ඃ-<br>කල් ඉකුත් වන දිනය ඃ- |

_____________________

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

6 වන නියෝගය

II වන උපලේඛනය

12. ඉල්ලුම්කරු සතුව පවතින තෙල් ඉවත් කිරීමේ උපකරණ පිළිබඳ විස්තර (කරුණාකර නල පරීක්ෂණ සහතිකය අමුණන්න)

| 12.1 තෙල් ඉවත් කිරීමේ නලයේ ලේබල අංකය | | දිග ප්‍රමාණය | පරීක්ෂා කළ දිනය |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

| 12.2 තෙල් ඉවත් කිරීමේ පොම්පය | | වර්ගය | ධාරිතාව |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

| 12.3 තෙල් පිටාර ගැනීම වැළැක්වීමේ ද්‍රව්‍ය | | වර්ගය | ප්‍රමාණය |
|---|---|---|---|
| තෙල් පිටාරගැලීම විසිර වීමේ ද්‍රව්‍ය | 1 | | |
| | 2 | | |
| අවශෝෂක සහ පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය | 1 | | |
| | 2 | | |
| | 3 | | |
| | 4 | | |

| වෙනත් උපකරණ | වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| | | |

13. ඉල්ලුම්කරු සතුව පවතින ආරක්ෂිත උපකරණ පිළිබඳ විස්තර

| ආරක්ෂිත උපකරණ | වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | | |

14. අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ මෙහෙයුම් කටයුතු සඳහා යොදවා ගනු ලබන තැනැත්තන් පිළිබඳ විස්තර (ලේඛනමය සාක්ෂි මගින් තහවුරුකර යුතු ය) ඃ

| නම | සුදුසුකම් (ඇත්නම්) | පළපුරුද්ද (ඇත්නම්) |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |

6 වන නියෝගය

II වන උපලේඛනය

15. අපද්‍රව්‍ය පැටවීමේ සහ ප්‍රවාහනය කිරීමේ ක්‍රමය:

| 15.1 වාහනය | වර්ගය (ලොරි/ප්‍රවාහන රථ/බවුසර්) | ධාරිතාව |
|---|---|---|
| | | |
| **15.2 නැවේ/බත්තලේ නම** | **ලියාපදිංචිය පිළිබඳ විස්තර** | **ධාරිතාව** |
| | | |

16. ඔබගේ සමාගම විසින් සිදු කරන ලද පූර්ව අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ මෙහෙයුම් පිළිබඳ විස්තර (කරුණාකර නිවැරදි විස්තර සපයන්න)

| අවුරුද්ද | 201x | 201x | 201x |
|---|---|---|---|
| අවසරපත්‍ර අංකයඃ | | | |

**17.** ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු සහතික වල පිටපත් (ඉදිරියෙන් ඇති කොටුව සලකුණු කරන්න)

| | |
|---|---|
| (අ) | සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන සංස්ථාගත කිරීමේ සහතික පත්‍රය. |
| (ආ) | ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA) විසින් නිකුත් කරන ලද, වරායක් ඇතුළත මෙහෙයුම් කටයුතු කිරීම සඳහා (අදාළ කාණ්ඩය වෙන්වෙන් වූ) බලපත්‍රය. |
| (ඇ) | අපද්‍රව්‍ය බැහැර කිරීම/ගබඩා කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය (CEA) විසින් නිකුත් කරන ලද උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රය. |
| (ඈ) | ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා අදාළ පළාත් පාලන ආයතනය හෝ නියෝජිත ආයතනය විසින් නිකුත් කරන ලද අවසර පත්‍රය. |
| (ඉ) | මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා අදාළ පළාත් පාලන ආයතනය හෝ නියෝජිත ආයතනය විසින් නිකුත් කරන ලද අවසර පත්‍රය. |
| (ඊ) | ISO සහතිකලත් තල පරීක්ෂණ සමාගමක් විසින් නිකුත් කරන ලද තල පරීක්ෂණ සහතිකය. |
| (උ) | නැව්/බත්තල් සඳහා - නැව් රෙජිස්ට්‍රාර්/මෙහෙයුම් නිශ්කාශන හා සමීක්ෂණ සහතිකය. |
| (ඌ) | රු. 300,000.00 ක බැංකු තැන්පතුව සනාථ කිරීම සඳහා ලංකා බැංකුවෙන් ලබා ගත් රිසිට්පත (තෙල් අපද්‍රව්‍ය කාණ්ඩය සඳහා සේවා සපයන්නකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා පමණි). |
| (එ) | ධීවර වරාය කළමනාකරුගෙන් ලබාගත් පිටසන් කිරීමේ ලිපිය (ධීවර වරායවල ධීවර යාත්‍රාවලින් අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණය කරන සේවා සපයන්නකු සඳහා පමණක් අවශ්‍ය වේ.) |

කරුණාකර අපගේ ............................................ නමැති සමාගම (සමාගමේ නම) 20xx වර්ෂය සඳහා ශ්‍රී ලංකා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සේවා සපයන්නකු වශයෙන් ලියාපදිංචි කරන ලෙස ඉල්ලා සිටිමි. මා විසින් 2016 සමුද්‍රීය පරිසර ආරක්ෂණ (අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම්) නියෝගවල අන්තර්ගත විධිවිධාන මැනවින් අධ්‍යයනය කරන ලද අතර එකී නියෝගවල සඳහන් විධිවිධාන සහ එකී නියෝග යටතේ වූ අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැලසීමට අදාළ ශ්‍රී ලංකා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ නියම හා කොන්දේසි මඟින් බැඳී සිටීමට මා එකඟ වන බව මම සහතික කර සිටිමි.

| ................................................ | ............................................. | ................................................... |
|---|---|---|
| ඉල්ලුම්කරුගේ නම | නිල මුද්‍රාව | ඉල්ලුම්කරුගේ අත්සන |

දිනයඃ- දිදි/මාමා/අඅඅඅ

6(1), 7(2) හා 8(1) වන නියෝග.

**III** වන උපලේඛනය

**නියෝග යටතේ අයකරනු ලබන ගාස්තු පිළිබඳ විස්තර**

| | | | | |
|---|---|---|---|---|
| අ | 6(1) නියෝගය | **ඉල්ලුම්පත්‍ර ගාස්තුව:-** | | **රු.1500.00** |
| | | | | |
| ආ | 7(2) නියෝගය | **ලියාපදිංචි ගාස්තුව:-** | | |
| | | **කොළඹ වරාය සඳහා ලියාපදිංචි ගාස්තු:-** | | |
| | | i. | කසළ හෝ මල අපද්‍රව්‍ය සඳහා පමණක් | රු. 30,000.00 |
| | | ii. | තෙල් අපද්‍රව්‍ය සඳහා පමණක් | රු. 100,000.00 |
| | | iii. | තෙල් අපද්‍රව්‍ය, කසළ හෝ මල අපද්‍රව්‍ය සඳහා පමණක් | රු. 120,000.00 |
| | | **වෙනත් යම් වාණිජ වරාය සඳහා ලියාපදිංචි ගාස්තු:-** | | |
| | | i. | කසළ හෝ මල අපද්‍රව්‍ය සඳහා පමණක් | රු. 7,000.00 |
| | | ii. | තෙල් අපද්‍රව්‍ය සඳහා පමණක් | රු. 15,000.00 |
| | | iii. | තෙල් අපද්‍රව්‍ය, කසළ හෝ මල අපද්‍රව්‍ය සඳහා පමණක් | රු. 21,000.00 |
| | | **සියලු වරායන්, නැව්තොටවල්, පර්යන්ත, නැව් අලුත්වැඩියා පොළවල්, නිර්ජල නැව්තටාකාංගන, නැංගුරම් ස්ථාන, අක්වෙරළ සමුද්‍ර ආශ්‍රිත පහසුකම් හෝ වෙනත් සමුද්‍ර ආශ්‍රිත පහසුකම් සඳහා ලියාපදිංචි ගාස්තුව:-** | | රු. 175,000.00 |
| | | | | |
| ඇ | 8(1) නියෝගය | **නැව්වලින් අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා වූ අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ අවසර පත්‍ර ගාස්තු :-** | | |
| | | i. | (ජලය වෙන් කිරීමෙන් පසුව) තෙල් අපද්‍රව්‍ය ප්‍රමාණය $5m^3$කට වඩා අඩුනම්, යම් යාත්‍රාවක් සඳහා සියලු අපද්‍රව්‍ය කාණ්ඩ වෙනුවෙන්; | රු. 5,000.00 |
| | | ii. | (ජලය වෙන් කිරීමෙන් පසුව)$5m^3$දක්වා වූ තෙල් අපද්‍රව්‍ය වෙනුවෙන්; | රු. 5,000.00 |
| | | iii. | $5m^3$ඉක්මවන සෑම තෙල් අපද්‍රව්‍ය එක් කියුබික් මීටරයක් ( $m^3$) වෙනුවෙන්; | රු. 1,000.00 |

---

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

7(3) නියෝගය

**IV වන උපලේඛනය**

**ලියාපදිංචි කිරීමේ සහතිකය**

**ශ්‍රී ලංකා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA)**

**(2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලදී.)**

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 21 වන සහ 51 වන වගන්ති ප්‍රකාරව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA) යටතේ අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැපයීම සඳහා සේවා සපයන්නකු වශයෙන් ..........................................හි පදිංචි .................................... යන අය (නම, ලිපිනය) 20XX/XX/XX වන දින සිට බලපවත්වන පරිදි ලියාපදිංචි කරනු ලබන බවසමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් සතුටින් දන්වා සිටිනු ලැබේ.

අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සමග ලියාපදිංචි වී සිටින සේවා සපයන්නන්ට නැව්වලින් පහත දැක්වෙන කාණ්ඩවල අපද්‍රව්‍ය භාරගැනීම සඳහා අවසර දෙනු ලැබේ.

(අ) තෙල් අපද්‍රව්‍ය :- අපවිත්‍ර බැලස්ට් ජලය, යන්ත්‍රාගාරවල පතුලේ රැඳෙන තෙල් මිශ්‍රිත ජලය, අපවිත්‍ර ජලය හා තෙල්බොර, ටැංකි සේදීම්, තෙල්, තෙල් පහන්කඩ, තෙල් මිශ්‍රිත යන්ත්‍රෝපකරණ නඩත්තු අවශේෂ කොටස්.

(ආ) කසළ :- ප්ලාස්ටික්, ෆෝම් වර්ග හා වෙනත් ඇසුරුම් ද්‍රව්‍ය, නැවෙහි ඇති සියලු වර්ගවල (අන්තරාදායක නොවන) ගෘහස්ථ කසළ, නැව්බඩු අවශේෂ.

(ඇ) මල අපද්‍රව්‍ය :- ඕනෑම ආකාරයක වැසිකිළි හා කැසිකිළි වෙතින් පිටවන මලපවහන සහ වෙනත් අපද්‍රව්‍ය හෝ සජීවී සතුන් සිටින ස්ථානවලින් පිටවන අපද්‍රව්‍ය හෝ වෛද්‍ය පරිශ්‍රවලින් පිටවන අපද්‍රව්‍ය හෝ මෙහි විස්තර කර ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍රවී ඇති වෙනත් අපවිත්‍ර ජලය.

(ඈ) වෙනත් :- (නිශ්චිතව දැක්විය යුතු ය) ....................................................................

කලින් අත්හිටුවනු ලැබුවහොත් හෝ අවලංගු කරනු ලැබුවහොත් මිස, මෙම ලියාපදිංචිය .............................................................. දින සිට ...........................................දින දක්වා වලංගුවේ.

සාමාන්‍යාධිකාරී,
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය.

නිකුත් කළ දිනය: .......................................

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, අංක 758, 2 වන මහල, බේස්ලයින් පාර, කොළඹ 09.
දුරකථන අංක:- (+9411)2687520 / 2690604 / 2690605, ෆැක්ස්:-(+9411)2687451 / 4615960 විද්‍යුත් ලිපිනය :- info@mepa.gov.lk

8(1) නියෝගය

**V වන උපලේඛනය**

කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි

| | | |
|---|---|---|
| IRP අංකය | | |
| අනුමත කරන ලදී | ඔව් | නැත |
| නිලධරයාගේ අත්සන | | |

**අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ අවසරපත්‍රයක් ලබාගැනීම සඳහා වූ ඉල්ලීම**

| | |
|---|---|
| IRP අංකය | |

වෙතː- සාමාන්‍යාධිකාරී, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය.

වෙතින් ː- ........................................................................................................

(ලියාපදිංචි සේවා සපයන්නාගේ නම සහ ලිපිනය)

1. නැව පිළිබඳ විස්තර
   - 1.1 යාත්‍රාවේ නම ː- ................................................................
   - 1.2 යාත්‍රාවේ වර්ගය ː- ..........................................................
   - 1.3 ධජය ː- ...............................................................................
   - 1.4 IMO අංකය ː- ...................................................................
   - 1.5 දළ ටොන් ගණන ː- .........................................................
   - 1.6 නැවේ අයිතිකරුගේ/ ක්‍රියාකරවන්නාගේ/ නෞකාධිපතිවරයාගේ/ අනුයෝජිතයාගේ නම ː- .......................................
   - 1.7 විශේෂිත අංකය හෝ අක්ෂර ː- ..........................................................
   - 1.8 පැමිණීමේ දිනය ː- ....................................................... පිටත්වීමේ දිනය ː- ..........................................................
   - 1.9 අවසාන වරාය ː- ......................................................... ඊළඟ වරාය ː- .................................................................
   - 1.10 යාත්‍රාවේ දේශීය අනුයෝජිතයාගේ නම ː-

2. ප්‍රතිග්‍රහණ පහසුකම පිළිබඳ සහ වරාය, නැව් තොට, පර්යන්තය, නැව් අලුත්වැඩියා පොළ, නිර්ජල නැව්තටාකාංගනය ආදිය පිළිබඳ විස්තරː-
   - 2.1 පිහිටි ස්ථානය හෝ පර්යන්තයේ නම ː- ..........................................................
   - 2.2 ප්‍රතිග්‍රහණ පහසුකම් සපයන්නාගේ නම ː- .......................................................

3. අපද්‍රව්‍යවල වර්ගය හා ප්‍රමාණය.

| තෙල් (I වන ඇමුණුම) | ප්‍රමාණය m3 | කසළ (V ඇමුණුම ) | ප්‍රමාණය m3 |
|---|---|---|---|
| යන්ත්‍රාගාරවල පතුලේ රැඳෙන තෙල් මිශ්‍රිත ජලය | | ප්ලාස්ටික් | |
| තෙල් අවශේෂ | | පාවෙන අපද්‍රව්‍ය, ඇතුරුම් හෝ ඇසුරුම් ද්‍රව්‍ය | |
| තෙල් ටැංකි සේදීම් අපවිත්‍ර බැලස්ට් ජලය | | බිම් කඩදාසි නිෂ්පාදන, පහන්කඩ, වීදුරු ලෝහ බෝතල් | |
| ටැංකි සේදීමෙන් ලැබෙන යකඩ මල සහ තෙල් බොර | | නැව් බඩු අවශේෂ, කඩදාසි නිෂ්පාදන, පහන්කඩ | |
| වෙනත් (සඳහන් කරන්න) | | වීදුරු, ලෝහ, බෝතල්, පිඟන් භාණ්ඩ | |
| මල අපද්‍රව්‍ය (IV වනඇමුණුම) | ප්‍රමාණය $m^3$ | ආහාර අපද්‍රව්‍ය | |
| | | පුලුස්සනු ලැබූ අළු | |

4. ප්‍රතිග්‍රහණ ක්‍රමයː- (පීප්ප/ ප්‍රවාහන රථ/ බත්තල්/ වෙනත්) ..........................................................

5. ලියාපදිංචි අංකයː- (පීප්ප/ ප්‍රවාහන රථ/ බත්තල්/ වෙනත්) ........................................................

| ................................. | ............................................ | ............................................................ |
|---|---|---|
| අත්සන | දිනය | සේවා සපයන්නාගේ නිල මුද්‍රාව |

8(3) නියෝගය

**VI වන උපලේඛනය**

**ශ්‍රී ලංකා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA)**

**අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ අවසරපත්‍රය**

අනුක්‍රමික අංකයඃ MP/WRS/3.............

ලියාපදිංචි අංකය ඃ-

IRP අංකය ඃ-

රිසිට්පත් අංකයඃ-

**I** | වන කොටස | ඉල්ලුම්කිරීමේ විස්තර සහ ප්‍රකාශය

1.1 ලියාපදිංචි සේවා සපයන්නාගේ නමඃ- ..........................................................................

1.2 යාත්‍රාවඃ

(අ) නම .................. (ආ) වර්ගය ............... (ඇ) ධජය ....................

(ඈ) නැව් ලැගුම .......................... (ඉ) පැමිණීමේ දිනය ............................ (ඊ) පිටත්වීමේ දිනය ...............................

1.3 අවසාන වරායඃ ........................... 1.4 ඊළඟ වරායඃ ...........................

1.5 යාත්‍රාවේ දේශීය අනුයෝජිතයාගේ නමඃ- ...........................

1.6 ප්‍රතිග්‍රහණය කිරීමට ඇති අපද්‍රව්‍යවල වර්ගය සහ ප්‍රමාණයඃ-

තෙල් අපද්‍රව්‍ය ........................... කසළ ........................... මල අපද්‍රව්‍ය ...........................

1.7 ප්‍රතිග්‍රහණ ක්‍රමය (සඳහන් කරන්නඃ- පීප්ප/ ප්‍රවාහන රථ/ බත්තල/ ට්‍රක්රථ/ වෙනත්) ...........................

1.8 පීප්ප/ ප්‍රවාහන රථ/ බත්තල/ ට්‍රක්රථ/ වෙනත් යනාදියේ ලියාපදිංචි අංක ...........................

1.9 බැහැර කිරීම පිළිබඳ විස්තරඃ-

| *අපද්‍රව්‍යවල වර්ගය* | *ප්‍රමාණය* | *බැහැර කිරීමේ පරිශ්‍රයේ නම සහ ලිපිනය* |
|---|---|---|
| තෙල් අපද්‍රව්‍ය | | |
| කසළ | | |
| මල අපද්‍රව්‍ය | | |

මෙම අවසරපත්‍රය සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා නියෝග මගින් බැඳී සිටීමටත්, යථා පරිදි සම්පූර්ණ කරන ලද MP/WRS/3. ........................... දරන (මෙම ලේඛනයේ) 1වන පිටපත අදාළ කටයුත්ත සම්පූර්ණ කිරීමෙන් පසුව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත ආපසු භාර දීමටත් එකඟ වෙමි.

............................................. ............................................. .............................................

සේවා සපයන්නාගේ නිලමුද්‍රාව අත්සන දිනය

**MEPA විසින් බලය පැවරීම**

| 2 වන කොටස | **MEPA විසින් සම්පූර්ණ කළ යුතු ය.** |
|---|---|

.............................................. යන අය 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ MEPA හි ලියාපදිංචි සේවා සපයන්නකු බවට මා විසින් සහතික කරනු ලබන අතර, ශ්‍රී ලංකා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙනුවෙන් WP/WRS/3 .............................................. දරන අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ අවසර පත්‍රය යටතේ ඉහත 1.2 හි සඳහන් යාත්‍රාවෙන් අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණය කිරීම සඳහා එම සේවා සපයන්නා වෙත මෙයින් බලය පවරමි.

............................................. ............................................. .............................................

MEPA නිලමුද්‍රාව අත්සන දිනය

අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණය සඳහා ඉහත 1.2 අයිතමයේ සඳහන් යාත්‍රාව මතට යාමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA) විසින් දෙනුලබන අවසරය.

| 3 වන කොටස | SLPA විසින් සම්පූර්ණ කළ යුතු ය. |
|---|---|

.............................................. .......................................................... ...............................................

නාවික අංශයේ නිලමුද්‍රාව | අවසරය ලබා දෙන නිලධරයාගේ අත්සන | දිනය

---

4.1 ප්‍රතිග්‍රහණ මෙහෙයුමේ කාලසීමාව (දින සහ වේලාවන්) ...............................................

| 4 අ කොටස | නැව් කපිතාන් විසින් සම්පූර්ණ කළ යුතු ය. |
|---|---|

| 4 ආ කොටස | සේවා සපයන්නා විසින් සම්පූර්ණ කළ යුතු ය. |
|---|---|

4.2 සම්පූර්ණ අපද්‍රව්‍ය ප්‍රමාණය යොමුව, අවසරපත්‍ර අංකය. ...................................... ....................................

(....................)

| MEPA-WR06 අවසර පත්‍ර අංකයඃ |
|---|
| |

සේවා සපයන්නාගේ නිල මුද්‍රාව සහ අත්සන. | දිනය.

4.3 තෙල් පිළිබඳ වාර්තා පොතේ / කසළ පිළිබඳ වාර්තා පොතේ සටහන් තබා තිබේද යන්න (ඔව් / නැත)

4.3.1 පිළිතුර ඔව් නම්, වාර්තා යොමුව ...............................................

4.3.2 පිළිතුර නැත නම්, (සටහන්) .......................................................

.........................................................................

නැවේ නිලමුද්‍රාව හා නැව් කපිතාන්ගේ අත්සන

ඉහත 4 අ කොටසේ සඳහන් අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණය රේගු අධීක්ෂණවලට යටත්ව සිදු කරන ලදී. බදු පනවනු ලැබී ය/ නොලැබීය. බදු පනවනු ලැබීනම් වාර්තා යොමු අංකය :- .............................................

| 5 වන කොටස | ශ්‍රී ලංකා රේගුව විසින් සම්පූර්ණ කළ යුතු ය. |
|---|---|

............................................. ................................................ .............................................

බලයලත් නිලධාරයාගේ අත්සන/ ශ්‍රී ලංකා රේගුව | දිනය | ශ්‍රී ලංකා රේගු නිල මුද්‍රාව

| 6 වන කොටස | අපද්‍රව්‍ය අවසාන වශයෙන් ප්‍රතිග්‍රහණය කරන තැනැත්තා විසින් සම්පූර්ණ කළ යුතු ය. |
|---|---|

මා විසින් වගුවට අනුව අපද්‍රව්‍ය ලබා ගන්නා ලදි.

| අපද්‍රව්‍යවල වර්ගය | ප්‍රමාණය (MT) | ප්‍රතිග්‍රහණ දිනය |
|---|---|---|
| තෙල් අපද්‍රව්‍ය | | |
| කසළ | | |
| මල අපද්‍රව්‍ය | | |

...................................................... ............................................ .....................................................

බලයලත් ප්‍රතිග්‍රාහකගේ අත්සන සහ නිලමුද්‍රාව | දිනය | EPL අංකය/ පළාත් පාලන ආයතන ලිපියේ අංකය ඃ

10(1) නියෝගය

## VII වන උපලේඛනය
## ශ්‍රී ලංකා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය.

### පැමිණීම පිළිබඳ දැන්වීම

යම් නැවක් පැමිණීමට යටත් පිරිසෙයින් පැය 24කට පෙර හෝ, යාත්‍රා කාලය පැය 24කට වඩා අඩු නම්, පූර්ව වරායෙන් නැව පිටත්වන අවස්ථාවේදී, එම නැවෙහි අයිතිකරු, ක්‍රියාකරවන්නා, නෞකාධිපතිවරයා හෝ අනුයෝජිතයා විසින් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත පහත දැක්වෙන විස්තර ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අදාළ තෙල් පිළිබඳ වාර්තා පොත, නැව්බඩු පිළිබඳ වාර්තා පොත හෝ කසළ පිළිබඳ වාර්තා පොත සමග මෙම ආකෘති පත්‍රය යාත්‍රාව මත තබාගත යුතු ය.

| |
|---|
| අපද්‍රව්‍ය පිට කරනු ලබන වරායේ, නැව්තොටේ, පර්යන්තයේ, නැව් අලුත්වැඩියා පොළේ, නිර්ජල නැව් තටාකාංගනයේ, නැංගුරම් ස්ථානයේ, අක්වෙරළ සමුද්‍ර ආශ්‍රිත පහසුකමේ හෝ වෙනත් සමුද්‍ර ආශ්‍රිත පහසුකමේ නම : |

**භාරදීමේ ආකෘතිපත්‍රය/පූර්ව දැන්වීමේ ආකෘතිපත්‍රය (ANF)**

1. නැව පිළිබඳ විස්තර
   - 1.1 නැවේ නම
   - 1.2 IMO අංකය
   - 1.3 දළ ටොන් ගණන
   - 1.4 නැවේ වර්ගය;තෙල් නැව
     - රසායනික දියර ප්‍රවාහන නැව
     - ඇසුරුම් රහිත භාණ්ඩ ප්‍රවාහන නෞකාව
     - බහාලුම
     - වෙනත් භාණ්ඩ ප්‍රවාහන නැව
     - මගී ප්‍රවාහන නැව
     - රෝ- රෝ
     - වෙනත් (සඳහන් කරන්න)
   - 1.5 අයිතිකරුගේ හෝ ක්‍රියාකරවන්නාගේ නම:-
   - 1.6 විශේෂිත අංකය හෝ අක්ෂරය
   - 1.7 ධජය දරන රාජ්‍ය
2. වරාය හා මුහුදු ගමන පිළිබඳ විස්තර
   - 2.1 ස්ථානයේ/පර්යන්තයේ නම හා නැවතුම් වරාය
   - 2.2 පැමිණීමේ දිනය හා වේලාව
   - 2.3 පිටත්වීමේ දිනය හා වේලාව
   - 2.4 අවසාන වරාය හා රට
   - 2.5 ඊළඟ වරාය සහ රට (දැන සිටිනම්)
   - 2.6 අපද්‍රව්‍ය පිටකරන ලද අවසාන වරාය

**පහසුකම වෙත පිට කිරීමට ඇති අපද්‍රව්‍ය වල වර්ගය සහ ප්‍රමාණය:**

| මාපෝල් ඇමුණුම I - තෙල් | ප්‍රමාණය ($m^3$) |
|---|---|
| යන්ත්‍රාගාරවල පතුලේ රැඳෙන තෙල් මිශ්‍රිත ජලය | |
| තෙල් අවශේෂ (තෙල් බොර ) | |
| තෙල් ටැංකි සේදීම් | |
| අපවිත්‍රබැලස්ට් ජලය | |
| ටැංකි පිරිසිදු කිරීමෙන් පිටවන යකඩ මල සහ | |
| තෙල් බොර | |
| වෙනත් (කරුණාකර සඳහන් කරන්න) | |

| මාපෝල් ඇමුණුම I I –NLS | ප්‍රමාණය ($m^3$)/නම[1] |
|---|---|
| X කාණ්ඩයේ ද්‍රව්‍ය | / |
| Y කාණ්ඩයේ ද්‍රව්‍ය | / |
| Z කාණ්ඩයේ ද්‍රව්‍ය | / |
| OS වෙනත් ද්‍රව්‍ය | / |
| වෙනත් (කරුණාකර සඳහන් කරන්න) | |

| මාපෝල් ඇමුණුම IV - මල අපද්‍රව්‍ය | ප්‍රමාණය ($m^3$) |
|---|---|
| | |

| මාපෝල් ඇමුණුම V – කසළ | ප්‍රමාණය ($m^3$) |
|---|---|
| ප්ලාස්ටික් | / |
| පාවෙන අපද්‍රව්‍ය හෝ ඇතුරුම් හෝ ඇසුරුම් ද්‍රව්‍ය | |
| බිම් කඩදාසි නිෂ්පාදන, පහන්කඩ, වීදුරු, ලෝහ, බෝතල්, පිගන් භාණ්ඩ ආදිය | |

1 වන පිටපත - MEPAවෙත භාරදීම සඳහා, 2 වන පිටපත - SLPA වෙත, 3 වන පිටපත - ශ්‍රී ලංකා රේගුව වෙත; 4 වන පිටපත - සේවා සපයන්නා වෙත.

(2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ විධිවිධාන යටතේ සහ 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලදී.)

ශ්‍රී ලංකාවේ කොළඹ 09, බේස්ලයින් පාර; අංක 758, 2 වන මහලෙහි පිහිටි සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් නිකුත් කරන ලදී.
දුරකථන:- +94 11 2687520/ 2690604 ෆැක්ස්:- 2687451/ 4615960 විද්‍යුත් ලිපිනය:- info@mepa.gov.lk වෙබ් අඩවිය:-www.mepa.gov.lk

2.7 අවසාන වරට අපද්‍රව්‍ය පිට කරන ලද දිනය

2.8 අපද්‍රව්‍ය පිට කිරීමේ ඊළඟ වරාය (දැන සිටීනම්)

2.9 මෙම ආකෘති පත්‍රය භාර දෙන තැනැත්තාගේ නම (නෞකාධිපතිවරයා හැර වෙනත් අයකු නම්)

| | |
|---|---|
| නැව්බඩු අවශේෂ[2], කඩදාසි නිෂ්පාදන, පහන්කඩ, වීදුරු, ලෝහ, බෝතල්, පිගන් භාණ්ඩ ආදිය | |
| ආහාර අපද්‍රව්‍ය | |
| පුලුස්සනු ලැබූ අළු | |
| වෙනත් අපද්‍රව්‍ය (සඳහන් කරන්න) | |

10(1) නියෝගය

## VII උපලේඛනය

| නෞකාවේ නම | IMO අංකය |
|---|---|

නැව මත ඉතිරි වී ඇති අපද්‍රව්‍ය සහ අවශේෂ ද්‍රව්‍යවල ආසන්න ප්‍රමාණය හා උපරිම ගබඩා ධාරිතා ප්‍රතිශතය කරුණාකර පහතින් සඳහන් කරන්න. මෙම වරායේදී නැව මත ඇති සියලු අපද්‍රව්‍ය ඔබ විසින් පිට කරන්නේ නම්, කරුණාකර පහත කොටුව තුළ (✓) සලකුණ යොදා වගුව කපා හරින්න. ඔබ විසින් අපද්‍රව්‍ය වලින් කොටසක් පිටකරන්නේ නම් හෝ අපද්‍රව්‍ය කිසිවක් මුදා නොහරින්නේ නම් කරුණාකර වගුවේ සියලු තීර සම්පූර්ණ කරන්න.

මෙම වරායේදී (1 වන පිටුවේ සඳහන් පරිදි) මෙම යාත්‍රාවේ ඇති සියලු අපද්‍රව්‍ය මා විසින් පිටකරනු ලබන බවට තහවුරු කර සිටිමි.

**මාපෝල් ඇමුණුම 1 තෙල්**

| වර්ගය | උපරිම වෙන්කළ ගබඩා ධාරිතාව $m^3$ | නැව මත රඳවාගත් අපද්‍රව්‍ය ප්‍රමාණය-$m^3$ | ඉතිරි අපද්‍රව්‍ය පිට කරනු ලබන වරාය (දැන සිටී නම්) | දැනුම් දීම සහ ඉදිරි නැවතුම් වරාය අතරතුර උත්පාදනය වේ යයි ඇස්තමේන්තු ගත අපද්‍රව්‍ය ප්‍රමාණය $m^3$ |
|---|---|---|---|---|
| යන්ත්‍රාගාරවල පතුලේ රැඳෙන | | | | |
| තෙල් මිශ්‍රිත ජලය | | | | |
| තෙල් අවශේෂ (තෙල් බොර) | | | | |
| තෙල් ටැංකි සේදීම් | | | | |
| අපවිත්‍ර බැලස්ට් ජලය | | | | |
| ටැංකි පිරිසිදු කිරීමෙන් පිටවන යකඩ | | | | |
| මල සහ තෙල් බොර | | | | |
| වෙනත් (කරුණාකර සඳහන් කරන්න) | | | | |

**මාපෝල් ඇමුණුම II NLS[1]**

| වර්ගය | උපරිම වෙන්කළ ගබඩා ධාරිතාව $m^3$ | නැව මත රඳවාගත් අපද්‍රව්‍ය ප්‍රමාණය-$m^3$ | ඉතිරි අපද්‍රව්‍ය පිට කරනු ලබන වරාය (දැන සිටී නම්) | දැනුම් දීම සහ ඉදිරි නැවතුම් වරාය අතරතුර උත්පාදනය වේ යයි ඇස්තමේන්තු ගත අපද්‍රව්‍ය ප්‍රමාණය $m^3$ |
|---|---|---|---|---|
| X කාණ්ඩයේ ද්‍රව්‍ය | | | | |
| Y කාණ්ඩයේ ද්‍රව්‍ය | | | | |
| Z කාණ්ඩයේ ද්‍රව්‍ය | | | | |
| OS වෙනත් ද්‍රව්‍ය | | | | |

1. අදාළ NLS හි නිවැරදි නාවුක නාමය සඳහන් කරන්න
2. වියළි නැව් බඩුවල නිවැරදි නාවුක නාමය සඳහන් කරන්න

**මාපෝල් ඇමුණුම IV මල අපද්‍රව්‍ය**

| වර්ගය | උපරිම වෙන්කළ ගබඩා ධාරිතාව $m^3$ | නැව මත රඳවාගත් අපද්‍රව්‍ය ප්‍රමාණය-$m^3$ | ඉතිරි අපද්‍රව්‍ය පිට කරනු ලබන වරාය (දැන සිටී නම්) | දැනුම් දීම සහ ඉදිරි නැවතුම් වරාය අතරතුර උත්පාදනය වේ යයි ඇස්තමේන්තු ගත අපද්‍රව්‍ය ප්‍රමාණය $m^3$ |
|---|---|---|---|---|
| මල අපද්‍රව්‍ය | | | | |

**මාපෝල් ඇමුණුම V කසළ**

| වර්ගය | උපරිම වෙන්කළ ගබඩා ධාරිතාව $m^3$ | නැව මත රඳවාගත් අපද්‍රව්‍ය ප්‍රමාණය-$m^3$ | ඉතිරි අපද්‍රව්‍ය පිට කරනු ලබන වරාය (දැන සිටී නම්) | දැනුම් දීම සහ ඉදිරි නැවතුම් වරාය අතරතුර උත්පාදනය වේ යයි ඇස්තමේන්තු ගත අපද්‍රව්‍ය ප්‍රමාණය $m^3$ |
|---|---|---|---|---|
| ප්ලාස්ටික් | | | | |
| පාවෙන අපද්‍රව්‍ය, ඇතුරුම් හෝ ඇසුරුම් ද්‍රව්‍ය | | | | |
| බිම් කඩදාසි නිෂ්පාදන, පහන්කඩ, වීදුරු, ලෝහ, බෝතල්, පිඟන් භාණ්ඩ ආදිය | | | | |
| නැව්බඩු අවශේෂ[2], කඩදාසි නිෂ්පාදන, පහන්කඩ, වීදුරු, ලෝහ, බෝතල්, පිඟන් භාණ්ඩ ආදිය | | | | |
| ආහාර අපද්‍රව්‍ය | | | | |
| පුලුස්සනු ලැබූ අළු | | | | |
| වෙනත් (සඳහන් කරන්න) | | | | |

| නම සහ තනතුර | අත්සන | දිනය | වේලාව |
|---|---|---|---|
| | | | |

12 - 856

1. අදාළ NLS හි නිවැරදි නාවුක නාමය සඳහන් කරන්න.
2. වියළි නැව්බඩුවල නිවැරදි නාවුක නාමය සඳහන් කරන්න.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.